# ජාතික සංවර්ධනයෙහි ලා කාන්තාවගේ දායකත්වය

*ආර්. ජී. යූ. වරකාදෙනිය මෙනෙවිය*
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගලේවෙල

**ජාතික සංවර්ධනය යන්න පිළිබඳ කථා කිරීමේදී සංවර්ධනය යන්නෙන් අදහස් කරන්නේ ආර්ථික වෘද්ධිය හෝ ආර්ථික නිෂ්පාදන වල වර්ධනය පමණක් නොවේ. එය වර්ධනය පමණකි. එහෙත් සංවර්ධනයක් සිදුවීමට නම් ආර්ථික සංවර්ධනය හා සමගාමීව අධ්‍යාත්මික වර්ධනයක්ද තිබිය යුතුය. සමස්ථ ප්‍රජාවගේම ආර්ථික සමාජිය සංස්කෘතිකමය ගති අංග උසස් ජිවන මට්ටමක් කරා වර්ධනය වීමක් විය යුතුය. මෙම ගමනේදී වත්මන් ශ්‍රී ලංකාවේ 16,800,000 ක් ඉක්මවමින් සිටින ජනගහනයෙන් 49% ක් වන කාන්තාවන්ගේ දායකත්වය කෙතෙක් දුරට ලබා ගනිමින් පවතිනවාද කොතෙක්දුරට අතීතයේදී ලබාගෙන තිබෙනවාද? ලබාගත හැකිද? එසේත් නැත්නම් එම පිරිසගේ දායකත්වය කොතෙක් දුරට අප විසින් නොසලකා හැර තිබෙනවාද යන්න කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිත වේ යයි අදහස් කරමි.**

පෙරදිග රටවල සම්ප්‍රදායික ගෘහ ජීවිතය හා පුළුල් සමාජ ජීවිතය අතර සැහෙන දුරස්ථ බවක් පැවති බව අපිට නොරහසකි. ඒ තුල කාන්තාව තම කාර්‍ය්‍ය භාරය හැටියට සිය සැමියා, දරු මල්ලන් බලා ගනිමින් ඔවුන්ගේ වැඩ කටයුතු ඔවුන් වෙනුවෙන් ඉටුකළයුතු යුතුකම් වගකීම්, ඉටු කරමින් යහපත් බිරිඳක මවක ලෙස ජිවත් වූවාය. එය එසේ පැවතුනද ඉතා සීග්‍රයෙන් ආර්ථිකයත් තාක්ෂණයත් සමග ඉදිරියට යන ලෝකයේ පෙරදිග කාන්තාවටද එම ගමන් මගට පිවිසීමට සිදුව ඇත. සීඝ්‍රයෙන් වෙනස්වන සමාජය තුල ඇයට සම්ප්‍රදායික දිවිපෙවෙතින් පියවර කීපයක් ඉදිරියට තබමින් රටේ නිෂ්පාදනයට හවුල් වීමෙන් ජිවන තත්ත්වය උසස් මට්ටමක තබා ගැනිමේ බර ඉසිලීමට සිදුවී ඇත. මේ සඳහා ඇයගෙන් ඉටුවන මෙහෙවර කොතෙක්ද යන්න පිළිබඳව අපගේ අවධානය යොමු කරවමු. 1985 / 86 ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ ශ්‍රමබල හා සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව ( ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ශ්‍රම බලකාය ) පහත දැක්වෙන වගුවෙන් දක්වා ඇත.

| | එකතුව | %ගණන | පිරිමි | % ගණන | ගැහැණු | %ගණන |
|---|---|---|---|---|---|---|
| මුළු ගණන | 5972001 | 100 .00 | 414584 | 67 .2 | 1957, 416 | 32 .8 |
| නාගරික | 1213008 | 100 .00 | 841529 | 69 .4 | 371, 479 | 30 .6 |
| ග්‍රාමීය | 423906 | 100 .00 | 2929007 | 68 .4 | 1354, 899 | 31 .6 |
| වතු | 475090 | 100 .00 | 244052 | 51 .4 | 231, 040 | 48 .6 |

රැකියාවන්හි නියුතු ජනගහනය ප්‍රධාන රැකියා වර්ග හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව

| ප්‍රධාන රැකියා වර්ගය | එකතුව | පිරිමි | ගැහැණු | % ගණන |
|---|---|---|---|---|
| මුළු ගණන | 5131745 | - | 1550408 | - |
| 1. වෘත්තීය කාර්මික හා සාමාන්‍ය සේවා | | 272890 | 137629 | 135261 |
| 2. පරිපාලන හා කළමණාකරණ සේවා | | 26398 | 24586 | 1813 |
| 3. ලිපිකරු සමාන්තර සේවා | | 280503 | 353219 | 88831 |
| 4. වෙළඳ සේවා | | 442050 | 353219 | 88831 |
| 5. සේවා සේවකයන් | | 241501 | 150406 | 91095 |
| 6. කෘෂිකාර්මික ක්ෂේත්‍රය | | 2438266 | 1610783 | 827483 |
| 7. නිෂ්පාදන හා සමාන්තර සේවකයින් (ගමනාගමන හා කම්කරුවන් ) | | 1420899 | 1086157 | 334733 |
| 8. වර්ගකර නැති | | 9248 | 8960 | 288 |

(ප්‍රභවය :- ශ්‍රමබල හා සමාජ ආර්ථික සමීක්ෂණය 1985 / 86 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව )

මෙම සංඛ්‍යා ලේඛණ තොරතුරු සැළකිල්ලට ගැනීමේදී පැහැදිලිව පෙනී යන කරුණක් නම් කාන්තාවද පිරිමියා හා ඉතා ආසන්නයෙන් ශ්‍රම බලකායට දායකත්වයක් ලබාදී ආර්ථික ගමනේදී හොද අත්වැලක් වී ඇති බවයි. ඒ අපගේ ගණනය කළහැකි, ගණනය කරනු ලබන, රැකියා ක්ෂේත්‍රයන්හී නියුක්ත වූවන්ගේ තත්ත්වය හා සංසන්දනය කලොත් පමණකි . මෙයට තවත් එකතු කළයුතු කොටසක් ද ඇත . එනම් නිදහස් වෙළඳ ආර්ථිකය තුල වැඩි ශ්‍රම හමුදාවක් යෙදී සිටින නිදහස් වෙළඳ කලාපය දෙස බැලීමෙනි .

මහ කොළඹ ආර්ථික කොමිෂම මගින් 1992 අප්‍රේල් මස 30 වෙනි දිනට ලබා ගන්නා ලද සංඛ්‍යා ලේඛණ තොරතුරු වලට අනුව නිදහස් වෙළඳ කලාපයේ සේවා නියුක්තිය වර්ග කල ආකාරය පහත වගුවේ සටහන් වේ .

| වෙළඳ කලාපය | කර්මාන්තය | ගැහැණු | පිරිමි |
|---|---|---|---|
| කටුනායක | 72 | 43391 | 6799 |
| බියගම | 31 | 13999 | 3296 |
| කලාපයෙන් පිටත | 45 | 11732 | 9257 |
| කොග්ගල | 07 | 1633 | 88 |

විශේෂයෙන් ගම්බද ඇගලුම් කර්මාන්ත ක්ෂේත්‍රය හා රටේ ආර්ථික වර්ධනයට දායකත්වයක් ලබාදී ඇති මැද පෙරදිග රැකියා ක්ෂේත්‍රයන්හී නියතු කාන්තාවන්ගෙන් ලැබී ඇති දායකත්වයද මෙහිදී ප්‍රසංසනීය තත්ත්වයක පවතී

මෙහිදී මවිසින් සදහන් කර ඇත්තේ ගණනය කළහැකි මුදලින් ශ්‍රමය මනින දායකත්වයක් සම්බන්ධයෙන් පමනි . මෙය ජාතික ආර්ථික සංවර්ධනය පිළිබද මිම්මේදී පැහැදිළිව දැක ගතහැකි දායකත්වයකි . කොතෙක් දුරට දායකත්වයක් ලබාදෙමින් සිටිනවාද ලබාදී තිබෙනවාද යන්න මුදලින් ගණනය කර ඉලක්කමින් ලබා ගැනීමට හැකියාවක් ඇත .

එහෙත් රටේ මුළු ජනගහනයෙන් සියයට අසූවක් ( 80 % ක් ) පමණක් වන ගම්බදව ජිවත් වන කෘෂිකර්මය ජිවනෝපාය කර ගනිමින් ජාතික උන්නතියට බලවත් මෙහෙයක් ඉටුකරන ගොවි පවුල් පාදක කොට ගත් කෘෂිකාර්මික පවුල් වල කාන්තාව සංවර්ධනයට ලබාදෙන ශක්තිය හා දායකත්වය පිළිබඳව කිසිවෙකුත් කිසිවිටෙකත් ගණනය කිරිමකට උත්සාහයක් කර නොමැති බව පෙන්වාදීම කාලෝචිතය .

"තොටිල්ල පදවන අත ලොව ආණ්ඩු කරයි ." යනුවෙන් කියමනක් වේ . කාන්තාව තම කාර්ය භාරය නිසි ලෙස ඉටු කළ සෑම කල්හිම ලොවට රජෙක් බිහිවනු ඇත . එසේ නම් කාන්තාව රටේ සංවර්ධනයෙහිදි තම දායකත්වය ප්‍රථමයෙන් ම රටට ලබාදෙන්නේ මවක් ලෙස රටට නිරෝගී ප්‍රයෝජනවත් දරුවෙකු ලබා දීමෙනි . සංවර්ධනයේ කොටස් කාරියක් විමේ දී පිරිමියාට වඩා සාර්ථක කොටස් කාරියක් විමට හැම අතින්ම ඇයට ශක්තිය ඇති බව දැනටමත් කාන්තාව ඔප්පු කර හමාරය . කිසිවෙකුගේ අනුදැනුමක් උපදේශයකින් හා මගපෙන්වීමකින් තොරව ඇය තම නිවසේ ඉතා හොද කළමණාකාරිනියක් වන්නීය . උපයන සුළු

මුදලින් ගෙදරම නඩත්තු කරයි . ස්වාමියාගේත් දරුවන්ගේත් ලෙඩට දුකට දරුවන්ගේ ඉගෙනීමට, අසල්වැසියාගේ දුකට සැපට ඇය මහත් හවුල් කාරියක් වන්නේ ය . අරපිරිමැස්මෙන් කටයුතු කරන, යායුතු නිසි මග පෙන්වා දෙමින් දරුවනුත්, සැමියාත් නිසි මග මෙහෙයවන කාන්තාව සංවර්ධන ක්‍රියාදාමයේ දායකත්වය ලබා ඇත්තේ අර්ථ සම්පන්නව සහභාගී වීමෙනි. පිරිමින් සමග සමව සිටිමින් ඉපයීමට ඇය තුල ඇති දක්ෂතාවයට වඩා අපගේ අවධානය යොමු කළ යුත්තේ ඇයට ලැබෙන මුදල අරපරිස්සමින් ඉතා සූක්ෂමව හැසිරවීමට හා එයින් ඉතා සුළු ගණනක් හෝ ඉතිරි කිරීමට ඇයගේ ඇති දක්ෂතාවයයි.

"ග්‍රාමීය කාන්තාව ඇනවීමකින් තොරව තම තමා විසින් ගොඩනගාගත් විශ්වාසයක් තුල හොඳ හුවමාරුකරුවන් ගණුදෙනුකරුවන් බවට පත්වී සිටින" සීට්ටු ක්‍රමය " මෙයට ඉතා හොඳ උදාහරණයකි. මා ලද එක්තරා අත්දැකිමක් මෙහිදී ඉතාමත් වැදගත් වේ යයි අදහස් කරමි . ව්‍යාපෘති 15000 යටතේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපලේ යෙදුනු දුප්පත් ජනසවි ලාභී කාන්තාවන් තමාට ඒදිනෙදා ලැබෙන රු 50 / - ක මුදලින් රු : 10 / - ක්. වැඩපල තුල තමාගේ කණ්ඩායම සමග ඉතිරි කරමින් සීට්ටු දැමීම කාන්තාවගේ ඉතිරි කිරීමෙ හැකියාව පෙන්නුම් කරන කැඩපතක් පමණක් නොව තම දහසකුත් එකක් ඕනෑකම් අමතක කර දමා ඉතිරි කිරීමට පෙළඹීම රටේ ආර්ථික සංවර්ධන කාර්යය භාරය කරට ගත් මුදල් ඇමති වරයෙකුගේ තත්ත්වයක් පෙන්නුම් කරයි . එක්තරා ප්‍රංශ කියමනක් වන " ගැහැණිය නිර්මාණ කොට තිබෙන්නේ පිරිමියාගේ මුදල් පසුම්බියටය" යන්න නිවැරදි බව ඔප්පු කරන හොඳ නිදසුනකි .

ඉතිරි කිරීමෙන් පමණක් නොව කාන්තාවන් වශයෙන් ගෘහ ජීවිතයේ දී තම කාර්ය භාරයට අමතරව සැමියාගේ සියලුම කටයුතු වලදී ගණනය නොකරන කාර්යභාරයකින් ඇය සංවර්ධනයට දායකත්වය ලබාදී ඇති බව අප කවුරුත් නොසළකා හැර තිබෙන අංශයක් බව කිව යුතුය . ගොවිපලේ වැඩ කරන සැමියාට හෝ කණ්ඩායමකට කෑම බිම උයාපිහා දීමෙන් , ගෙදරින් ඉවතලන කොල රොඩු අලු සියල්ල එකතුකොට, පැත්තකින් පරිසරය පිරිසිදු කරන අතර තව පැත්තකින් හොඳ කොම්පෝස්ට් වලක් නිෂ්පාදනය කරන ඇය ගොවිපලට පොහොර ලබා දීමෙන් ද දායක වෙයි . බිම් සැකසීම, තවාන් පාලනය, පාත්ති දැමීම, පැළ සිටුවීම, වල් නෙලීම , ජලය සැපයීම, අස්වනු නෙලීම , අස්වනු වෙළඳ පොළට සුදුසු ආකාරයෙන් ශුද්ධ කිරිම, ගබඩා කිරීම, සියලු දේටම කාන්තාව සිය සියුමැලි දෑතින් දායකත්වය ලබා දෙන්නීය ඇයගේ මේ දායකත්වය කිසිවෙක් කිසිවිටෙකත් ගණනය කිරිමක් කර නොමැත. කුලී කරුවාට දිනකට රු : 80 ක් 100 ක මුදලක් දී ඔහු වැඩෙහි යොදවා ගනී . දහසකුත් එකක් කටයුතු මැද්දේ ඇය තම ගොවිපලේ කරන කටයුතු වලට සැමියාගේ කටයුතුවලදී වන සහාය ගණනය කලොත් එය කොපමණ මුදල් සම්භාරයක් විය හැකිද? මේ ගණනය නොකරන දායකත්වය තුලින් දැයේ දියුණුවට කාන්තාවගෙන් ඉටු වන්නේ මිළ කළ නොහැකි මෙහෙයකි .

කෘෂිකාර්මික කාන්තාව ගැන කථා කිරිමේදී පාරම්පරික කෘෂිකාර්මික ගම්මාන වලින් වෙනස් වූ පරිසරයක ජීවත් වන සංවර්ධනයේදී විශාල මෙහෙයක් ඉටු කරන අමතක කල නොහැකි තවත් කාන්තාවන් පිරිසකි . ඒ මහවැලි කලාප වල ජීවත් වන කාන්තාවයි . ශ්‍රි ලංකාවේ දැවැන්ත යෝජනා ක්‍රමයක් වන මහවැලි යෝජනා ක්‍රමය තුල " එච් .ජී . සී . බී . ඒ හා ඩී කලාප " මෙසේ මහවැලි ජලාශයෙන් පෝෂිත භූමි භාගයක් වන අතර , එය අද සශ්‍රික ජනවාස බවට පත්ව තිබේ . මෙම සංවර්ධන යෝජනා ක්‍රමයන්හී මෙම කලාපයන්හී කෘෂි අංශය ව්‍යාප්තව පවතී. ශ්‍රි ලංකාවේ වී නිෂ්පාදනයෙන් 45 % ක් පමණද වියළි මිරිස් නිෂ්පාදනයෙන් 33 % ක් පමනද සුළු ආහාර භෝග වලින් 25% ක් පමණද මෙම කලාප වලින් ලැබේ. මෙම නිෂ්පාදන ක්‍රියාවලියේදී පුරුෂ පක්ෂය මෙන්ම ස්ත්‍රී පක්ෂය ද එක සමාන සේවාවක් සපයන බව නොරහසකි . ඇත්තෙන්ම මහවැලි සංවර්ධන කාර්යයයේ දී කාන්තාවට විශාල වගකීම් කොටසක් ඉටු කිරීමට සිදුවී ඇත. කෘෂිකාර්මික කටයුතු වලදි ඇය ඉතාමත් කාර්යශූර උද්යෝගීමත් බවකින් කටයුතු කරන්නිය.

ගෘහ පාලන කටයුතු හා දරුවන්ගේ පෝෂණයට වඩා වැඩි ශ්‍රමයක් ඇය තම පවුලේ ආර්ථික දියුණුව සඳහා කරන්නීය . කෘෂි කටයුතු වලදී ඇය තම කාර්ය භාරය ඉටු කරන්නී සැමියාගේ වැඩ කොටසින් අඩක් පමණ සම්පූර්ණ කර දෙමින් ඇය කුඹුරට ඇඹුල ගෙනයාමේ කාර්යයට අමතරව මඩ පෑගීම , නියර බැදීම , පැළ සිටුවීම , ගොයම් කැපීම ආදියේ දක්ෂ ලෙස නිරත වන්නීය . මිරිස් නිෂ්පාදනයේ දීද මිරිස් පැළ සිටුවීමේ අදහස සමග අස්වනු නෙලනා තෙක් ඉටුකළයුතු සියලුම කාරයභාරය ඉතාමත් ඕනෑකමින් ඉටු කරන්නීය . වෙහෙස නොබලා තරහකාරී ලෝකයේ තම පවුලේ ආර්ථිකයේ ඉදිරි දියුණුව සඳහා ඇපකැප වී කටයුතු කරන්නේ දැඩි උනන්දුවක් හා ඕනෑකමකිනි .

එමෙන් ම කෘෂිකාර්මික පවුල්වල කාන්තාවන් වැඩි පිරිසක් තම ගෙවතු වලින් ගෙදර දොරේ ආහාරය සඳහා එලවලු, පළතුරු, කොලවර්ග ලබා ගනිමින් කුස්සියේ ආර්ථිකය සවිමත් කරන අතර, සත්ව පාලනයෙන් ආර්ථිකයට තවත් ශක්තියක් එකතු කිරීමේ යෙදී සිටින්නීය . වත්මන් ශ්‍රි ලංකාවේ නිෂ්පාදනය කරන කිරි වලින් 80 % ක් පමණ මෙම කාන්තාවන්ගේ මහන්සියේ ප්‍රතිඵලයක් බව කීවද එය නිවැරදි යැයි හැගේ .

එපමනක් නොව දරුවන් හදාවඩා ගැනීම, සමාජ ජීවිතය, සංස්කෘතික වටිනාකම් ඉදිරියට රැක ගැනීම, පරිසර සුරක්ෂණය, සෞඛ්‍යය, පෝෂණය වැඩි දියුණු කිරිම ආදී සමාජයීය වශයෙන් ඇති සියලුම ගුණාංග වලට ඇගේ දායකත්වය පිරිමියාගේ දායකත්වයට වඩා ඉහළ ප්‍රතිශතයක් ගත්තේ, පවුලේ ගෘහ මුලිකයා ගෘහනිය , පතිනිය, මව, සහෝදරිය, අසල්වැසි කාන්තාව , මිතුරිය යන සියලුම ගෞරව නාමයන්ගෙන් පිදුම් ලබමිනි . එසේ නම් කාන්තාවන් ජාතික ආර්ථික වර්ධනයට පමණක් නොව පොදුවේ ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ දී ගණනය කළ හැකි හා සියලු කාර්යයන්හී යෙදී සිටින කාන්තාවන්ගේ දායකත්වය පිරිමියාගේ දායකත්වය හා සමාන්තරව අත්වැල් බැද ගනිමින් යන බව කිව යුතුව ඇත .

අකුරු කියවිමේදී හා ලිවිමේ හැකියාව පිළිබඳ සංඛ්‍යා සටහන් වලින් ඇය ජාතික සංවර්ධනයේ දී ලබාදී ඇති දායකත්වය තව දුරටත් පැහැදිලි කළ හැකිය .

| වර්ෂය | ගැහැණු | පිරිමි |
|---|---|---|
| 1963 | 67 . 3 | 76 . 9 |
| 1971 | 70 . 9 | 78 . 5 |
| 1981 | 82 . 4 | 86 . 5 |

(ප්‍රභවය ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව )

මෙවන් දායකත්වයක් ලබාදී ඇති කාන්තාව එම දායකත්වය ලබාදීම නොසලකා හැර ඇති අවස්ථා, ඉහතින් පෙන්වා දී ඇති ගණනය නොකරන මෙහෙයක් ඉටු කරන කාන්තාවන් පිළිබඳව සැලකිල්ල යොමු කිරීමේ දි නොකියාම බැරිය .